ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

**<u>ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය රාමදාන් ප්‍රීතිය බෙදා දෙයි</u>**

ශුද්ධ වූ රාමදාන් මාසයේ දී කොළඹ, ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය විවිධ වැඩසටහන් සංවිධානය කර තිබිණ.

2. 2025 මාර්තු 4 වන දින ගෝල් ෆේස් හෝටලයේ දී ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා විසින් ඉෆ්තාර් උත්සවයක් පවත්වන ලදී. බස්නාහිර පළාත් ආණ්ඩුකාර හනීෆ් යූසුෆ් මහතා මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී විය. ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍ය මුනීර් මුලාෆර් මහතා, විපක්ෂ නායක සජිත් ප්‍රේමදස මහතා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, ශ්‍රී ලංකාවේ පිහිටි තානාපති කාර්යාලවල ප්‍රධානීන් සහ නියෝජිතයන්, ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන්, අධිකරණ, ව්‍යාපාරික සහ වෙනත් ක්ෂේත්‍රයන්හි සාමාජිකයන් රැසක් ද මෙම උත්සවය සඳහා සහභාගී වූහ.

3. මාසය තුළ දී, මහ කොමසාරිස් කාර්යාලය සහ කොන්සියුලර් ජනරාල් කාර්යාල විසින් උත්සව කට්ටල සහ අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල අවශ්‍යතා සහිත පවුල් වෙත බෙදා දෙන ලදී.

4. විවිධ ඉල්ලීම් මත පදනම්ව, දේශීය ආයතන, සංගම් සහ ප්‍රජා සාමාජිකයන් හා සම්බන්ධීකරණයෙන් මාර්තු 16 වන අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය පුත්තලම දිස්ත්‍රික්කයේ පවුල් වෙත බෙදා දෙන ලදී; මාර්තු 20 වන දින කොළඹ සහ මාර්තු 21 වන දින කුරුණෑගල විවිධ ප්‍රදේශවල අවශ්‍යතා සහිත පවුල් වෙත වියළි සලාක පාර්සල් බෙදා දෙන ලදී. යාපනයේ ඉන්දීය කොන්සියුලර් ජනරාල් කාර්යාලය විසින් 2025 මාර්තු 26 සහ 27 වන දින

යාපනය, මන්නාරම, නයිනතිවු සහ වේලනායි ප්‍රදේශවල පවුල් සඳහා අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය බෙදා දෙන ලදී.

5. සුවිශේෂී ඉන්දියා - ශ්‍රී ලංකා සම්බන්ධතාවයේ දෙරට ජනතාව අතර සබඳතා තවදුරටත් ශක්තිමත් කරමින් ශුද්ධ වූ රාමදාන් මාසය තුළ උත්සව ප්‍රීතිය බෙදා දීම මෙම වැඩසටහන්වල අරමුණ විය.

***

**කොළඹ**
***2025*** මාර්තු ***28***